ආධාර චක්‍රලේඛ අංක 05

තුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
තැ.පෙ. 1474,
කොළඹ 03.
1988.12.05

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත.

මාතෘකාව: තේ වගා කටයුතු සඳහා අනුයෝජිතයකු පත් කිරීම

1:0 **චක්‍රලේඛයේ පරමාර්ථය:**

1:1 ඉඩම අයිතිකරු වගා කටයුතුවල නොයෙදෙන අවස්ථාවලදී අයිතිකරුගේ අනුයෝජිතයකු ලෙස ක්‍රියා කිරීම සඳහා අයිතිකරු විසින් ඇටෝර්නි බලය පවරනු ලබන ලිපියක් අධිකාරියේ කටයුතු සඳහා පිළිගනු ලැබේ. එවැනි අවස්ථා සඳහා උදාහරණ නම්:- ඉඩම අයිතිකරු දුරබැහැර පදිංචිවීම, වයෝවෘද්ධවීම, රෝගාතුරවීම, ඉඩම බදුදීම, හවුල් අයිතිය ඇති ඉඩම්වල සියලු අයිතිකරුවන්ගේ කැමැත්ත මත එක් පුද්ගලයකු වගා කටයුතු කරගෙන යාම ආදියයි.

දැ නටමත් අධිකාරිය විසින් පිළිගනු ලබන ක්‍රමය අනුව ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ වෙනත් බලය ලත් තැනැත්තකු විසින් සහතික කොට දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඉදිරිපත් කරනු ලබන ඇටෝර්නි බලය පැවරීමට අමතරව වගාකරුවන්ට පහසුවන පරිදි අනුයෝජිතයකු පත් කිරීමේ සරල ක්‍රියා මාර්ගයක් අනුගමනය කිරීම මෙම චක්‍රලේඛයේ පරමාර්ථයයි.

2:0 **ක්‍රියා මාර්ගය**

2:1 ඉඩම අයිතිකරුගේ අනුයෝජිතයා විසින් අධිකාරියේ නීත්‍යානුකූලව ලියාපදිංචිවීම සඳහා මේ සමග අමුණා ඇති නීතිපතිවරයා විසින් අනුමත කරන ලද ආකෘතිය නිසි පරිදි සම්පූර්ණ කොට ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර්වරයෙකු හෝ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයකු, ඕනෑම විනිශ්චයකාරවරයකු හෝ මහේස්ත්‍රාත්වරයකු විසින් සහතික කිරීමෙන් ඇටෝර්නි බලය ලබාගෙන ඉදිරිපත් කළ යුතුය.

2:2 ඉඩම අයිතිකරු මියයාම නිසා එම අයිතිකරුගෙන් ඉඩම පැවරෙන්නාහට එසේ නීත්‍යානුකූලව පවරා ගන්නාතෙක් මෙම ආකෘතිපත්‍රය මගින් පැවරෙන අනුයෝජිතත්වය දැරීමට පුලුවන.

2:3 මෙසේ පත් කරනු ලබන අනුයෝජිතත්වය අයිතිකරු මිය යාම නිසා අවලංගුවන තෙක් හෝ අයිතිකරුගේ ලිඛිත නියෝගයක් මත නැවත අවලංගු කරනතෙක් අධිකාරිය සමග කරනු ලබන සියලුම කටයුතු සඳහා වලංගු ලෙස පිළිගත යුතුය.

(වී. කේ. නානායක්කාර)
සභාපති.

පිටපත්:- 1. සාමාන්‍යාධිකාරී
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
3. සහකාර සාමාන්‍යාධිකාරී (මඵල්)
6. සියලුම තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරීන්

වගා ආධාර චක්‍රලේඛ අංක 05
සඳහා ඇමිණුම.

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|
| ඉල්ලුම්පත් අංක. අවසරපත්‍ර අංක. |

(6)

කුඩා තේ වතු සංවර්ධන සහනාධාර ක්‍රම යටතේ

**තේ වගා කිරීම සඳහා අනුයෝජිතයකු පත් කිරීම**

(1) ඉඩමේ නම: ..................................................

(2) පිහිටීම:

දිස්ත්‍රික්කය: .................... ප්‍රා. උ. දි. කොට්ඨාශය: ..............

ග්‍රා.සේ. වසම: .................... ගම : ....................

(3) ඉඩමේ ප්‍රමාණය: අක්:...... රූඩ් ...... පර් ....... (හෙක්:............)

(4) ඉඩමට අදාල හිමිකම් ඔප්පුවේ/*දීමනා බලපත්‍රයේ අංකය, දිනය හා ඔප්පුව සහතික කරන ලද නොතාරිස්තැනගේ නම සහ ලිපිනය:

*ඔප්පුව/දීමනා බලපත්‍රයේ අංකය: .............. දිනය: ..............

ඔප්පුව සහතික කරන ලද නොතාරිස්තැනගේ නම සහ ලිපිනය: ..............

...................................

(5) ඉඩම අයිතිකරු/අයිතිකරුවන්ගේ සම්පූර්ණ නම/නම්: ලිපිනය

1.

2.

3.

4.

5.

අංක 121/7 සහ 1981.01.01 දිනැති ගැසට් පත්‍රයේ සඳහන් 1980, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය (තේ වගා කිරීමේ) සහනාධාර *නියෝග යටතේ* සහ එහි කලින් කල කරන ලද සංශෝධන වල පරිදි ඉහත සඳහන් ඉඩමේ අයිතිකරු/*වන් වන මම/අපි ඉහත දක්වා ඇති ඉඩමේ තේ වගා කිරීම සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් දෙනු ලබන සහනාධාර සඳහා ඉල්ලුම් කිරීම, මුදල් ගනුදෙනු කිරීම සහ ඒ පිළිබඳ ලිපි ගනුදෙනු කිරීම ඇතුළු සියලුම කටයුතු සඳහා පූර්ණ බලය ඇති මගේ/අපගේ අනුයෝජිත ලෙස ......................................................................... හි පදිංචි ......................................................................... *මහතා/*මහත්මිය/*මෙනවියට මෙයින් බලය පවරමි/මු:

* තවද ඉහත දී ඇති බලතල පරිදි එම අනුයෝජිත විසින් කරන කවර කටයුත්තක් වුවද මා/අප විසින් කරන ලද කටයුත්තක් ලෙස සලකා වගකීම භාර ගනිමි./*ගනිමු. අධිකාරිය විසින් වරින් වර මෙම බලතල යටතේ එම අනුයෝජිතයාට ගෙවන සියලුම මුදල් මට/*අපට ගෙවූ මුදල් සේ සලකන අතර, වැඩ අතපසු කිරීමෙන් හෝ වෙනත් අයුරකින් අධිකාරිය නිකුත් කරන අවසර පත්‍රය යටතේ ආපසු ගෙවීමට ඇති මුදල් මෙම අනුයෝජිතයා නොගෙවන අවස්ථාවක් වුවහොත් එම මුදල්

මෙම පත්කිරීම අවලංගු කිරීමට අවශ්‍යවූ විට ඒ පිළිබඳව අධිකාරියට ලියාපදිංචි තැපැලෙන් දැන්වීමක් කළයුතු බවත්, එම අවලංගු කිරීම වලංගු වන්නේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය එම අවලංගු කිරීමේ දැන්වීම පිළිගත් බවට කරන ලද ලිඛිත දැන්වීමකින් පසුව බවත් මින් පිළිගනිමි./ගනිමු.

| ⁎නම/නම් | අයිතිකරුවන්ගේ අත්සන/අත්සන්⁎ |
| --- | --- |
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |

ඉහත සඳහන් ඉඩමේ අයිතිකරු/අයිතිකරුවන් වශයෙන් එහි නම/නම් සඳහන් අය විසින් ඉහත දැක්වෙන ප්‍රකාශය කියවා බලා 19 .................... දින මා ඉදිරිපිට අත්සන් කරන ලදි.

සහතික කරන්නාගේ නිල මුද්‍රාව

..............................
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ තනතුර: ..............

(මෙම ප්‍රකාශය ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයකු, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර්වරයකු හෝ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයෙකු, ඕනෑම විනිශ්චයකාරවරයකු හෝ මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ කර ඔහු විසින් සහතික කළ යුතුය.)

සාක්ෂි:-

(1) අත්සන :

නම :

ලිපිනය :

ස්ථානය :

දිනය :

(2) අත්සන :

නම :

ලිපිනය :

ස්ථානය :

දිනය :

සටහන්:

1. මෙම ආකෘතිය සම්පූර්ණයෙන්ම පිරවිය යුතුය. යම්කිසි කරුණක් අදාල නොවේනම් ඒ බව සඳහන් කළ යුතුය.
2. ⁎ අදාල නොවන වචන කපා හරින්න.

**අවවාදයයි : ව්‍යාජ දිවුරුම් ප්‍රකාශයක් සැපයීම දණ්ඩ නීති සංග්‍රහය යටතේ සිර දඬුවම් ලැබිය හැකි වරදකි.**